සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

85 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ගෘහ ආර්ථික විද්‍යාව I, II
மனைப் பொருளியல் I, II
Home Economics I, II

# ගෘහ ආර්ථික විද්‍යාව II

* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

පෙරේරා මහතාගේ පවුලේ සාමාජිකයින් තිදෙනෙකි. මුල් ළමාවියෙහි පසුවන දියණියක් මෙම පවුලෙහි සිටින අතර, ඔහුගේ බිරිඳ ගර්භිණී අවධියේ පසුවන්නී ය. පෙරේරා මහතා පරිරක්ෂිත ආහාර සකස් කිරීමේ ව්‍යාපාරයක් නිවසේ පවත්වාගෙන යයි. එම පවුල සීමිත ඉඩකඩ සහිත නිවසක ජීවත් වෙයි. බිරිඳ සැමියාගේ ව්‍යාපාරයට සහාය වන අතර, පවුලේ අවශ්‍යතා පිළිබඳව ද වෙහෙසෙන්නී ය. මෙම පවුල මනා සෞඛ්‍ය තත්ත්වයකින් පසුවේ.

(i) මෙම පවුල සඳහා දෛනික ආහාරවේල් සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.

(ii) මුල් ළමාවියේ දියණිය සඳහා ආහාරවේල් සකස් කිරීමේ දී හා පිළිගැන්වීමේ දී අනුගමනය කළ යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.

(iii) ආහාර පරිරක්ෂණය වැදගත් වීමට හේතුවන කරුණු **දෙකක්** ලියන්න.

(iv) පරිරක්ෂණය කළ ආහාරවල ගුණාත්මක ලක්ෂණ රැක ගැනීම සඳහා ඇසුරුම් කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු **දෙකක්** ඉදිරිපත් කරන්න.

(v) දියණිය සඳහා ඇඳුම් මෝස්තර නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු **දෙකක්** ලියන්න.

(vi) බිහි වීමට සිටින ළදරුවාට ඇඳුම් නිර්මාණය කිරීම සඳහා රෙදි තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(vii) මෙම පවුල සතු මානව සම්පත් සඳහන් කරන්න.

(viii) මෙම නිවසෙහි තැබිය හැකි ඉඩකඩ පිරිමසින ගෘහභාණ්ඩ **හතරක්** නම් කරන්න.

(ix) ගර්භිණී මව විසින් අනුගමනය කළ යුතු සෞඛ්‍ය පිළිවෙත් **හතරක්** ලියන්න.

(x) ගර්භිණී මවගේ මනා පෝෂණ තත්ත්වය සඳහා පූර්ව ප්‍රසව සායනයෙන් සැපයෙන ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

WWW.OLEVELAPI.COM

2. ඇඳුම් මැසීමට පෙර සමහර රෙදි පිරියම් කළ යුතු වේ.

(i) (a) රෙදි පිරියම් කිරීම යනුවෙන් කුමක් අදහස් වේ ද?

(b) පිරියම් කිරීමේ ක්‍රම **දෙකක්** පැහැදිලි කරන්න.

(ii) පහත දැක්වෙන්නේ මුල් ළමාවියේ දරුවෙකුට ගවුමක් මැසීම සඳහා ලබාගත් මිනුම් කිහිපයකි.

- පපුව වටා - සෙ.මී. 60
- ඉන වටා - සෙ.මී. 55
- උරහිස සිට ඉන දක්වා උස - සෙ.මී. 27

මෙම මිනුම් භාවිත කර ළමා ගවුම් පතරොම නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් මිනුම් ගණනය කර දක්වන්න.

(a) පපුව ඉදිරිපස මිනුම

(b) ඉන පිටුපස මිනුම

(c) අත්කට මිනුම

(iii) නූල් ඇදීම සහ වාටි මැස්ම, ඇඳුම් මැසීමේ දී භාවිත කරන මූලික මැහුම් ක්‍රම දෙකකි.
මෙම මැහුම් ක්‍රම දෙක මසා නිම කරන අයුරු පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

3. (i) හඳුන්වන්න.
   (a) මූලස්ථ පරිවෘත්තික වේගය (BMR)
   (b) ශරීර ස්කන්ධ දර්ශකය (BMI)
(ii) මහලු අවධියේ පසුවන්නකු සඳහා සුදුසු රාත්‍රී ආහාර වේලක බොජුන්පතක් සැලසුම් කරන්න. එහි ඇතුළත් එකිනෙක ආහාර තෝරා ගැනීමට හේතු දක්වන්න.
(iii) නිවසට පැමිණි අමුත්තන් දසදෙනෙකුට රාත්‍රී ආහාර වේලක් සඳහා මේසය සකස් කරන අයුරු දළ රූපසටහනක් මගින් ඉදිරිපත් කරන්න.

4. (i) පිළියෙල කළ ආහාරවල ගුණාත්මක ලක්ෂණ ආරක්ෂා වීම සඳහා අලෙවි කරන්නෙකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් **තුනක්** සඳහන් කරන්න.
(ii) (a) තාප සංක්‍රාමණ ක්‍රම නම් කරන්න.
   (b) ආහාර වර්ගයක් නම් කර, එය පිසීම සඳහා අදාළ ප්‍රධාන තාප සංක්‍රාමණ ක්‍රමය පැහැදිලි කරන්න.
(iii) (a) මාළු ඇඹුල්තියල් සෑදීමේ දී යොදන පරිරක්ෂණ කාරක සඳහන් කරන්න.
   (b) මාළු ඇඹුල්තියල් සෑදීමේ ක්‍රියාවලිය පියවර ඇසුරෙන් ලියන්න.

5. (i) ගෘහ සැලසුම් මූලධර්මයක් වන 'රාශීකරණය' හඳුන්වන්න.
(ii) 'තුලනය' මෝස්තර මූලධර්මයකි. කාමරයක් තුළ විධිමත් තුලනය ඉදිරිපත් කළ හැකි අයුරු රූපසටහනක් මගින් දක්වන්න.
(iii) ඒකවර්ණ ගැළපුමක් යොදා ගනිමින් විසිත්ත කාමරයක් අලංකාර කරන අයුරු පැහැදිලි කරන්න.

6. (i) ස්ත්‍රී ලිංගික හෝර්මෝන නම් කර, ඒවායේ කෘත්‍ය සඳහන් කරන්න.
(ii) පූර්ව ප්‍රසව සංවර්ධන අවධි තුන පැහැදිලි කරන්න.
(iii) උදෑසන ඔක්කාරය සහ වමනය ගර්භිණී අවධියේ දී දක්නට ලැබෙන ලක්ෂණයකි. මෙයට හේතු දක්වා, මෙම තත්ත්වය අවම කර ගැනීමට ගත හැකි පියවර සඳහන් කරන්න.

7. (i) ආරය හා පරිසරය දරුවන්ගේ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක දෙකකි.
   (a) ආරය
   (b) පරිසරය
   හඳුන්වන්න.
(ii) යොවුන්වියෙහි දරුවන්ගේ කායික වර්ධනය පිළිබිඹු කරන ලක්ෂණ **හතරක්** පැහැදිලි කරන්න.
(iii) 'සමාජයට යොමු වීමට යෞවනයා කැමැත්තක් පෙන්වයි.' උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න.

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....